# Poems Corner

## අලුයම

❖ අලුයම හිරු පායලා
කිචි බිචි නද පැතිරිලා
දෙමපියන් නැමදලා
පාසල් යමු හිනැහීලා

❖ කඳු අතරින් ඉර පායයි
මල් පෙති මත පිනි දිලිසෙයි
ගස් වල් සතුටින් ඉපිලෙයි
අලුයම සිත් පහන් කරයි

❖ ලා හිරු රැස් විහිදුවමින්
මඳ පවනේ සිසිල දෙමින්
කෙත් යාය ද නිල්ල දෙමින්
අලුයම  එයි කුරුලු නදින්

❖ උදෑසනින් මල් පපිලා සුවඳ හමනවා
අකාසේ කුරුලු රෑන් පියඹා යනවා
හිමිදිරියේ සමනල්ලු ද පිය සලනවා
මල් සුවඳින් පරිසරයම සුව්ද කෙරෙනවා

By: Poornaka Nadeeshan Menuwarage

Grade 8



Poornaka Nadeshan Menuwarage
Grade 8
St. Aloysius College - Galle,
Sri Lanka